# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2108/13 - 2019 ජනවාරි මස 28 වැනි සඳුදා - 2019.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* 1782.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/7/2016/එච්ඩබ්ලිව්/392.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ වැලම්ටියාව (ඊ 440 ඩී) ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වැලම්ටියාව ගමෙහි සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක 1745, හා 2018.09.14 දිනැති කැබලි අංක 1 - 3 (කැබලි 3 ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1060 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දඹුලු රජමහා විහාරය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0124.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: වෙත්තියාය; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දඹුලු රජ මහා විහාරය, ඒකනායක මුදියන්සේලාගේ ඥානතිලක විසින් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0833.

03. **කැබලි අංක 3**
ඉඩමේ නම: වෙත්තියාය; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දඹුලු රජ මහා විහාරය, වෙල්විදානයලාගේ සිසිර විසින් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0103.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ

ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.02.25 වැනි දින පෙ.ව 10.00 ට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019.02.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්.පී.පී.ඒ.හේවාපතිරණ
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2019 ජනවාරි මස 23 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-430

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය:* WEG/LAN/L1/ACQ/04.

ඉහත කරුණ සම්බන්ධව අංක 2068/30 හා 2018 අප්‍රේල් 26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීම වෙත අවධානය යොමු කෙරේ. එම දැන්වීමේ පරීක්ෂණ දිනය 2018 ජූනි මස 13 යනුවෙන් ද, ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමේ දිනය 2018 ජූනි මස 06 යනුවෙන් ද සඳහන් වේ.

එම දැන්වීමේ **පරීක්ෂණ දිනය: 2019 අප්‍රේල් මස 24 වැනි දිනය** වශයෙන් ද, **ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමේ දිනය: 2019 අප්‍රේල් මස 17 වැනි දිනය** වශයෙන් ද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කේ.පී.ජී. සුමිත් ශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2019 ජනවාරි මස 21 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-431

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.